**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010 වර්ෂය**

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විතවේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව**

1 කොටස

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශිර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |

2. **වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ව විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැසුම් වර්ෂය තුළ පිළියෙල කර ඉදිරිපත් කර තිබණි.

3. **ගිණුම්**

3.1 **විසර්ජන ගිණුම**

(අ) **ගිණුම් ඉදිරිපත් කිරිම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු වට අදාල විසර්ජන ගිණුම්02ක් 2011 අප්‍රේල් 04 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | විසර්ජන ශිර්ෂය | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 106 | 2011 අප්‍රේල් 04 |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 304 | 2011 අප්‍රේල් 01 |

**(ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 01 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,484,077,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,262,943,498 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ එක් එක් ශුද්ධ ප්‍රතිපාදනයන්ට අදාල ශුද්ධ ඉතිරිවීම් රු.77,009,445 ත් රු.144,124,057 ත් අතර පරාසයක ප්‍රමාණයන්ගෙන් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 28 ත් අතර පරාසයක පැවතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 482,777,000 | 730,980,000 | 457,426,890 | 612,206,053 | 25,350,110 | 118,773,947 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 149,680,000 | 120,640,000 | 144,808,682 | 48,501,873 | 4,871,318 | 72,138,127 |
| | එකතුව | 632,457,000 | 851,620,000 | 602,235,572 | 660,707,926 | 30,221,428 | 190,912,074 |

## 3.2 අත්තිකාරම් ගිණුම්

### 3.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 02 ක් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) සීමා පිළිපැදීම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණි.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | උපරිම වියදම් සීමාව | තථ්‍ය | අවම ලැබීම සීමාව | තථ්‍ය | උපරිම හර ශේෂ සීමාව | තථ්‍ය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 10601 | 4,000,000 | 2,447,657 | 1,600,000 | 2,568,254 | 11,500,000 | 11,273,739 |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 30401 | 1,200,000 | 12,040,101 | 6,700,000 | 8,951,164 | 55,000,000 | 36,923,528 |

### 3.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

#### 3.3.1 අග්‍රිම ගිණුම්

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවත එන රු. 395,820 ක් වූ හර ශේෂයක් තිබුණි.

#### 3.3.2 පොදු තැන්පත් ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 01ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂයන්ගේ එකතුව රු.19,608,438 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අමාත්‍යාංශය | ශීර්ෂය | ගිණුම් අංකය | කාල විශ්ලේෂණය | | | | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | | | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2ට අඩු | වර්ෂ 2 ට වැඩි 5ට අඩු | වර්ෂ 5 ට වැඩි | |
| | | | රු. | රු. | රු. | රු. | රු. |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 106 | | 14,711,502 | - | - | - | 14,711,502 |
| කාලගුණ විද්‍යා | 304 | 6000/0003/558 | - | - | 727,948 | - | 727,948 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දෙපාර්තමේන්තුව | 304 | 6000/0015/0159 | 2,794,392 | 1,374,596 | - | - | 4,168,988 |

## 11 කොටස

## එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශිර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ වාර්තාව 2011 සැප්තැම්බර් 07 දින අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

( අ) අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැව් නියැද පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | විසර්ජන ගිණුම අනුව 2010 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.212,106,517ක් වූ අතර, අමාත්‍යාංශය විසින් අදාළ චක්‍රලේඛය ප්‍රකාරව විධිමත්ව යාවත්කාලීන වූ ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකරන ලද. |
| (ii) පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ආ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 08 ක් සදහා සලසා තිබුණු එකතුව රු. 2,435,000 ක වු මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක් සදහා අධි ප්‍රතිපාදන සලසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ත් 96 අතර වු පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 66 යටතේ එක් වැය විෂයයකට රු. 8,432,500 ක් මාරු කර තිබුනද වර්ෂය අවසානයේ ඉන් සියයට 75.73 ක් හෙවත් රු. 10,929,553 ක ප්‍රතිපාදන ඉතිර් වී තිබුණි.

(iv) පරිපූරක ඇස්තමේන්තුවක් මගින් ලබාගෙන තිබුණු රු. 50,000,000 ප්‍රතිපාදන වලින් වර්ෂය අවසානයේදී ඉන් සියයට 12ක් හෙවත් රු 6,053,256 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

ආපදා සහන සේවා ආයතනය 2010 මැයි මස සිට අමාත්‍යාංශය යටතට පවරා ගෙන තිබුණු අතර එම ආයතනයට අදාලව මුදල් රෙගුලාසි 756 අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. පවරා ගන්නා ලද වත්කම්වල වටිනාකම්ද ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 1.5 බැංකු ගිණුම මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලැපුම් කළයුතු ශේෂ**

2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 6කට වැඩි වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ රු.7,400 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මු.රෙ.396(ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

## 1.6 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 16 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 4 | 3 | 1 |
| (iii) | ද්විතියක මට්ටම | 74 | 58 | 1 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 74 | 29 | 18 |
| | එකතුව | 145 | 106 | 39 |

===== ===== ====

## 2. විසර්ජන ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ වාර්තාව 2011 සැප්තැම්බර් 07 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත්පත් අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 හා අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සමාලෝචිත

වර්ෂයට අදාල විසර්ජන ගිණුම අනුව රු.453,352,326 ක් වූ ස්ථාවර වත්කම්, චක්‍රලේඛය ප්‍රකාරව ලේඛනගත වී නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

(i) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 3,080,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 63 ක්, සියයට 91 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

(i) මුදල් රෙගුලාසි 371 කට පටහැනිව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර කාර්ය නිමවී මාස 01 සිට 02 දක්වා කාල ප්‍රමාදයන් සහිතව අග්‍රිම පියවීම් සිදුකර පැවති අවස්ථා නිරීක්ෂණය විය.

(ii) තත්කාර්ය වෙනුවෙන් වැය වන මුදල පිළිබඳව නිවැරදි ඇස්තමේන්තුවකින් තොරව අවස්ථා 09 කද එකතුව රු.77,625 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් නිකුත් කර තිබුණි.

**(ඇ) පොදු තැන්පතු ගිණුම**

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු. 727,948 ක් වූ තැන්පතු ශේෂ 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 30401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ අනුව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.291,879 ක්වූ අතර, එම හිඟ හිට ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය වත්කම්**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග ලෙස ලැබුණ රු. මිලියන 10 ක් වටිනා ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුර තුළ ස්ථාපනය කර ඇත රේඩාර් යන්ත්‍රය මගින් 1982 සිට 1993 යන කාල පරිච්ඡේදය තුළ බටහිර බෙංගාල බොක්කේ වර්ධනය වන සුළි කුණාටුවල වර්ධනය සහ ගමන් මාර්ගය පිළිබඳව අඛණ්ඩව අනතුරු ඇඟවූ අතර, එය ශ්‍රී ලංකා වෙරළට වැදෙන්නට විනාඩි 30 කට පෙර කාලගුණ විද්‍යා දෙපාර්තමේනතුවට අනතුරු ඇඟවීමට හැකියාව තිබුණි. මෙම උපකරණය ක්‍රියා විරහිත වීමෙන් පසුව 2005 වර්ෂයේදී අළුතවැඩියාවන් සිදු කරන ලද අතර, ඉන්පසු කිසිදු අළුත්වැඩියාවන් සිදු නොකර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දින අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධන 2009 දෙසැම්බර් 09 දින අංක 441 දරන රාජ්‍ය මුදල චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2011 මාර්තු 31 දිනට ප්‍රථම සිදු කර වාර්ථා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් , දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2011 මැයි 31 දිනදීය.

(ii) 2010 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌණතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් අදාල විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම්

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **චක්‍රලේඛ විධිවිධාන** | | |
| **මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය** | | |
| මු.රෙ. 225 හා අංක එම්එෆ්6/1/1/96 හා 1996 | 521,375 | (අ) නිලධාරීන් 09 දෙනෙකු විසින් තම විදෙශ ගමන යාමට පෙර |

| | |
|---|---|
| අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛයේ 2.1.4 වගන්තිය | අත්තිකාරම් ලබාගැනීමට අදාලවූ වවුචර් පත ඉදිරිපත් නොකර මුදල් ලබාගෙන තිබුණි. |
| මු.රෙ. 264 | අත්තිකාරම් පියවීමේදී ඒ සඳහා වූ ලිඛිත සාක්ෂි ගණනය කිරීම් පියවීම් වවුචර සමඟ ඉදිරිපත් කර නොතිබීමෙන් ලබාගත් දීමනාවල නිවැරදිතාවය තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය. |
| අංක එම්එෆ්6/1/1/96 හා 1996 - අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛයේ 2.1.8 වගන්තිය | වියදම් දැරීම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීමට පෙර අදාල නිලධාරියා විසින් අනිවාර්යයෙන්ම දිවයිනෙන් බැහැරව යාම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, අග්‍රාමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමට පෙර නිලධාරීන් දිවයිනෙන් බැහැර ව තිබුණි. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| අංක 21/2007 හා 2007 - සැප්තැම්බර් 11 දිනැති චක්‍රලේඛයේ 10.9 වගන්තිය | දිවයනෙන් බැහැරව ගත කිරීම සඳහා ස්වකීය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නිවාඩු දීමට ප්‍රථම, දිවයිනෙන් බැහැරව යාම සඳහා ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සෑහීමකට පත් විය යුතු වුවද, නිලධාරීන්ට අවසර ලැබී ඇත්තේ එම නිලධාරීන් දිවයිනෙන් බැහැරව යාමෙන් පසුවයි. |

## 2.6 කාර්යසාධනය

2010 වාර්ෂික ඇස්තමේන්තු / ක්‍රියාකාරී සැලසුම්වලට අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබූ බව නිරීක්ෂණය විය.

(අ) ඩොප්ලර් රේඩාර් පද්ධතිය ස්ථාපනය සඳහා 2010 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 95 ක් විය. ක්‍රියාකාර් සැලැස්මට අනුව 2010 දෙසැම්බර් 31 දින වනවිට මෙය ස්ථාපනය කර අවසන් කල යුතු වුවත්, 2011 ජූනි මස වනවිටත් මෙම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාර් සැලැස්මට අනුව 2010 වර්ෂයේ මාර්තු, අප්‍රේල් මාසවලදී මොරටුව විශ්ව විද්‍යාලය විසින් හෝ කොළඹ විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන පාඨමාලාවට කාලගුණ විද්‍යාඥයින් සහභාගී කරවීමට රු.50,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණද, 2010 වර්ෂය තුළ එවැනි පාඨමාලාවකට නිලධාරීන් සහභාගී කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂාවසනයට එම ප්‍රතිපාදන මුළු ප්‍රමාණයම ඉතිරි වී තිබුණි.

## 2.7 පාඩු හා හානි

දෙපාර්තමේන්තුවේ වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන අවස්ථා 7කට අදාළ රු.1,091,458 ක්වූ අලභ හානි සම්බන්ධයෙන් මුරෙ. 104 හා 109 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) කාලගුණය හා දේශගුණය පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීමට ලෝක කාලගුණ විද්‍යා සංවිධානය වෙතින් 2009 නොවැම්බර් මාසයේදී රු.1,081,141 ක් ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු අතර 2009 වර්ෂයේ දී ඉන් රු.111,885 ක වියදමක් දරා එක් සම්මන්ත්‍රණයක්ද, 2010 වර්ෂයේ දී රු.534,005 ක වියදමක් දරා සම්මන්ත්‍රණ 03 ක්ද පවත්වා තිබුණු අතර, ඉතිරි මුදල වූ රු.435,251 ක් ලෝක කාලගුණ සංවිධානය වෙත ආපසු යවා තිබුණි. ඊට හේතුව වශයෙන් දෙපාර්තමේන්තුව දක්වා තිබුණේ සම්මන්ත්‍රණ මාලාවේ සංවිධාන කටයුතු කල නිලධාරියා අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවී ඇති බැවින් ද දෙපාර්තමේන්තු නිලධාරීන් දෙපාර්තමේන්තු රාජකාරි වලට බාධා නොවන අයුරින් සහභාගී කරවීමට සිදුවීමත්, ගොවි මහතුන් සහ කෘෂි නිලධාරීන් සංවිධානය කර ගැනීම අපහසු වීමත් යන කරුණුය.

(ආ) ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය ස්ථාපනයේ අරමුණ වූයේ කඩිනමින් තත්කාලීන දත්ත ලබා ගැනීම වුවද, මෙම පද්ධතියේ දුර්වලතාවයන් නිසා 2010 වර්ෂයේදී ද ඉහත අරමුණු ඉටු කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය හා සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය පරීක්ෂා කිරීමේදී, ප්‍රාදේශීය කාර්යාල 08 ක නිලධාරීන් 09 දෙනෙකුගේද, කම්කරුවන් 01 අයෙකුගේද, ආදේශ කම්කරුවන් 05 දෙනෙකුගේද පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. මෙම පුරප්පාඩු හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවල කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන් සිදු වීමටත්, ලබා දෙනු ලබන දත්තවල විශ්වාසවන්තභාවය සහ නිවැරදිභාවය සම්බන්ධයෙන් ගැටළු සහගතවීම.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 150 | 127 | 23 |
| (ii) | තෘතියික මට්ටම | 122 | 92 | 30 |
| (iii) | ද්විතියක මට්ටම | 85 | 76 | 09 |
| | එකතුව | 357 | 295 | 62 |

### (ආ) පුරප්පාඩු පුරවා නොතිබීම

ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලයෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඉවත් කර තිබුණු අතර, 2011 ජුනි වනවිටත් නැවත නිලධාරීන් පත්කර නොතිබුණි.

## 2.10 අභ්‍යන්තර පාලනය

### අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමේදී සමස්ථ කටයුතු ආවරණය වන පරිදි සැලැස්ම සකස් කළ යුතු වුවද, ඉදිරිපත් කරන ලද විගණන සැලැස්මට ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු ඇතුළත් කර නොතිබුණි.